**The Journal of Studies in Humanities**

**Volume 6 (I) 2020**

Department of Humanities, Rajarata University of Sri Lanka

# භික්ෂු සංස්ථාවෙහි අවශ්‍යතා පූරණය සඳහා විහාරස්ථ කුඹුරු ඉඩම්හි ආදායම් යොදාගත් ආකාරය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

## (රජරට සභ්‍යත්ව අවධියට විශේෂිත අධ්‍යයනයකි)

එම්.ජ්. ප්‍රසාද් කුමාර

***Correspondence:***
prasadmallawaarachchi85@gmail.com

***Specialty Section:***
History

***Received:***
15 February 2021

***Revised:***
11 August 2021

***Accepted:***
11 August 2022

***Published:***
02 January 2023

***Citation:***
කුමාර, ප්‍රසාද්, එම්.ජ්. (2020). භික්ෂු සංස්ථාවෙහි අවශ්‍යතා පූරණය සඳහා විහාරස්ථ කුඹුරු ඉඩම්හි ආදායම් යොදාගත් ආකාරය පිළිබඳ විමසුමක් (රජරට සභ්‍යත්ව අවධියට විශේෂිත අධ්‍යයනයකි). *මානවශාස්ත්‍ර අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය.* 6(1), 51-65.

ISSN (Online): 2961-564X

ISSN (Print) : 2362 - 0706

## Abstract

Investigative research is done in this study to determine how the Bhikshu Corporation's demands were met using the proceeds from the temple paddy lands. Many people have stepped forward to donate land for the temples since it was crucial to have a steady source of income as the monk organization grew in order to support the intricate needs of the temples. The most prevalent sort of land provided for temples by royals, nobility, and regular people is paddy land.The common people were given lands by the temple to cultivate, and their incomes were used in an organized way to meet residents' necessities, carry out the religious duties, and complete the temple's renovation projects. While conducting this study, primary and secondary sources that have already been published and are relevant to the project were studied, with a secondary focus on

libraries. Numerous deposit records and reports at the Colombo and Kandy state archives were studied, together with epigraphic sources, under the archeological source. On the basis of all of that information, the datas is critically evaluated, and conclusions are made. This article looks into the grants of paddy land to temples, their income levels, the security of those lands in the future, and how to provide for temple needs using documentary proof.

***Keywords:*** land, managememt, paddy land, temple

## හැඳින්වීම

පුරාතන ලංකාවේ භික්ෂු සංස්ථාවෙහි ඒකායන පරමාර්ථය වූයේ ලෞකික බැඳීම් වලින් සම්පූර්ණයෙන් ඈත්ව ලෝකෝත්තර දියුණුව පිණිස ආගමික කාර්යයන්ගේ නිමග්න වීමයි. ධනය, ධනෝපායන මාර්ග ආදී සියලු ම ආර්ථික කටයුතුවලින් වියුක්තව මනස නිදහස් ජීවිතයක් ගත කිරීම එහි මූලික අවශ්‍යතාව විය.ගිහියන් සිය කැමැත්තෙන් ලබා දෙන ඕනෑම දෙයක් භුක්ති විඳිමින් ඉතා සරල ජීවිතයක් ගත කළද කාලානුරූපීව මෙම තත්ත්වය ක්‍රමයෙන් වෙනස් වී යනු හඳුනා ගත හැකි ය. භික්ෂු ගහණය වැඩිවත්ම ආරාම ප්‍රමාණයද ඊට සාපේක්ෂව වැඩි වූ අතර මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ භික්ෂු අවශ්‍යතා සංකීර්ණ වීමයි. නේවාසිකයන්ගේ ප්‍රත්‍ය හා වෙනත් අවශ්‍යතා සපුරා ලීමත්, ආගමික අවශ්‍යතා පිරිමසාලීමත් සඳහා විහාරයට ස්ථාවර ආදායම් මාර්ගයක් අත්‍යවශ්‍ය විය. මේ හේතුව නිසාම රාජකීයයන්, වංශවතුන් සහ සාමාන්‍ය ජනතාව විසින් විහාරවලට ඉඩම් පරිත්‍යාගයන් සිදු කළ අතර කුඹුරු ඉඩම් වැදගත් ධනෝපායන මාර්ගයක් බවට පත් වී තිබේ. අභිලේඛන මූලාශ්‍රයවලින් හෙළිවන විහාරස්ථ කුඹුරු ඉඩම්, ඒවායේ ආදායම් ප්‍රමාණ හා  භික්ෂූන් සහ විහාර අවශ්‍යතා පිරිමසාගත් ආකාරය පිළිබඳව විමසා බැලීමක් මෙම අධ්‍යයනය තුළින් සිදු කෙරේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී මූලික වශයෙන් පුස්තකාල අධ්‍යයනය කරන ලද අතර ඒ යටතේ ප්‍රස්තුතයට අදාළ ව මෙතෙක් පළ වී ඇති ප්‍රාථමික හා ද්විතීයික මුලාශ්‍රය අධ්‍යයනයට ලක් කෙරිණි. පුරාවිද්‍යාත්මක මුලාශ්‍රය යටතේ ගිරි ලිපි, පුවරු ලිපි, ටැම් ලිපි, ආදී අභිලේඛන මූලාශ්‍රය අධ්‍යයනය කළ අතර කොළඹ සහ මහනුවර රාජ්‍ය ලේඛනාගාරයන්හි තැන්පතු ලේඛන හා වාර්තා, රැසක් අධ්‍යයනයට ලක් කෙරිණි. සෙනරත් පරණවිතාන, ඉන්ද්‍රකීර්ති සිරිවීර  වැනි විද්වතුන් ඉදිරිපත් කළ පර්යේෂණ හා නිරීක්‍ෂණ වාර්තා ද දෙවන මුලාශ්‍රය වශයෙන් පරිශීලනය කෙරිණි. එම සියලු දත්ත පදනම් කොටගෙන ප්‍රස්තුතය විචාරාත්මක ප්‍රවේශයකින් සාකච්ඡාවට බඳුන් කර නිගමනවලට එළඹීම මෙහි ක්‍රමවේදය වෙයි.

*ISSN (Online): 2961-564X ISSN (Print) : 2362 - 0706*

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ආදායම් උපදින මාර්ග වශයෙන් විහාරවලට කුඹුරු ප්‍රදානය කිරීමේ ව්‍යාපාරය ආරම්භ වූයේ ක්‍රි.පූ. දෙවන සියවසේ අවසාන භාගය තරම් පැරණි කාල වකවානුවේ දී ය. විහාරාරාමවලට පූජා කරන ලද කුඹුරු ඉඩම් මගින් සමකාලීන යුගයේ ඉඩම් භුක්තියේ ස්වරූපය පිළිබඳව අදහසක් ගොඩනගා ගත හැකි ය. ශ්‍රී සුමංගල ශබ්දකෝෂයට අනුව කුඹුරු යනු 'ගොයම් වැවෙන දිය සහිත කෙත' ය (ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, 1999:282). කෙත හෙවත් ඛෙත්ත යන්න ද 'කුඹුර' යන අරුත දීමට යෙදෙන්නකි. ත්‍රිපිටක අර්ථ කෝෂයට අනුව 'සාරඛෙත්ත' යනු සරුසාරවත් කුඹුර යන අර්ථ දෙන්නකි (ත්‍රිපිටක අර්ථකෝෂය, 2550:100). කුඹුර, කුබර, කෙත, විය ආදී නම්වලින් ද ශිලාලේඛනවල දැක්වේ. පූජාවක් පිළිබඳ සඳහන් කරන රිටිගල ශිලා ලිපියේ ද කුබර හා කෙත යනුවෙන් සඳහනක් (Paranavithana, 1983:09) දැකිය හැකි ය. 'උර්වරා' යන්නෙන් ද, 'කෙදාර' යන්නෙන් ද 'කුඹුර' යන්න නිෂ්පන්න වූ බවට මත දෙකක් පවතී. විශේෂයෙන් වංශකතාවල 'කුඹුරු' වැනි නොපැහැදිලි ගණයේ වචන භාවිත කිරීම නිසා විහාරවලට දුන් දේපළවල විශාලත්වය පිළිබඳ ව පැහැදිලි අදහසක් ගොඩනගා ගැනීම අසීරු වී ඇත. රසවාහිනියේ කරිස 400 ක (අක්කර, 1400) කුඹුරු යායක් රෝහණයේ වූ බව සඳහන් කර ඇත (රසවාහිනිය, 1928එ 37). බිල්ලෑවේගල ශිලා ලිපියෙහි ස්ථූපයක් සඳහා අඩකිරියක කුඹුරු වෙන්කිරීමක් පිළිබඳ ව සඳහන් කර තිබේ[1] (Paranavithana, 1983 : 88 ). මෙහි එන 'අඩකිරිය' යන වචනය කුඹුරු ප්‍රදාන පිළිබඳ ප්‍රමාණාත්මක සාධකයක් වේ. 'කිරියක්' යනු අමුණු හතරකි. ඒ අනුව විහාරය සඳහා වෙන් කර දී ඇත්තේ අඩකිරියක් හෙවත් අමුණු 02 ක් බව පැහැදිලි ය. අඩකිරියක කුඹුරු වෙන් කළා යැයි දැක්වීම මගින් කුඹුරෙන් අඩකිරියක භුක්තිය භික්ෂූන්ට පැවරූ බවක් අදහස් වේ. මෙහි 'නියතෙ' යැයි එන සඳහන මගින් අඩ කිරියක කුඹුරු භුක්තිය භික්ෂූන් විෂයෙහි නිශ්චය කොට ලබාදුන් බවක් ද අදහස් වේ.

### විහාරස්ථ කුඹුරු ඉඩම් ප්‍රදාන සහ ආදායම් සහිත මධ්‍යස්ථාන බවට පත්වීම

විහාරස්ථ නේවාසිකයන්ගේ සංකීර්ණ අවශ්‍යතා පූර්ණය කර ගැනීම සඳහා ස්ථාවර ආදායම් මාර්ගයක් ලෙස කුඹුරු ඉඩම් විහාර සන්තක කිරීමේ ක්‍රියාවලියෙහි රාජකීයයන්ගේ ප්‍රදාන කැපී පෙනේ. අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් දූනුමඩලාකන්ද ශිලා ලිපිය[2] (Paranavithana, 1983:09-10) චෛත්‍යයකට පූජා කරන ලද කුඹුරු පිළිබඳ ව විස්තරයක් ඉදිරිපත් කරයි.

1 බිල්ලෑවේගල ශිලා ලිපිය, ''උපසක තිසහ විහර - තුබ කරිති බතර - පිත චෙතිය අඨය අඩකරිහි දිනෙ ඉත උපසකහ පුතහ උපසක - කඩිය ලෙණෙ අගත - අනගත චතු - දිසික සගය නියතෙ.

2 දූනුමඩලාකන්ද ශිලා ලිපිය,
"සි කුටකන - ගමිණි අබයහ පුත
බාතිය - මහරජහ දිගති
(ගම) මජෙක - වපික- කෙතහි චෙත - කුබර කිරිහකි වටම කෙතහි තිනිපති
ඒකල ගමක - කෙතහි චෙත කුබර තරිහකි මරොජ - කෙතහි චෙත - කුබ
ර කරහිකි තිසයවිල - කෙතහි චෙත තුබර කරිහති
තබර - කෙතහි චෙත - තුබරි කරිහකි පතව්කොදිය- කෙතහි අමෙතම
ලිතය චෙතහට කුබර දිනි කරහක පනහගමක දතහ චෙත - තුබරි
කරිහකි මලවිය - කෙතහි චෙත- කුබර - කරි හකි පනහගමක
තෙතහි චෙත - කුබර කරිහකි තලතරවිය - කෙතහි චෙත - කුබර
කරිහකි කදාත ගම - කෙතහි චෙත - කුබර කරිහකි"

පෙළෙහි සඳහන් ආකාරයට භාතිකාභය රජු විසින් චෛත්‍යයකට පූජා කරන ලද කුඹුරු කරිස ප්‍රමාණ පිළිබඳ එකින් එක සඳහන් කිරීමක් දැකිය හැකි වේ. ලිපියේ සඳහන් ආකාරයට පිළිවෙළින් මජෙක වාපික කෙතෙන් කුඹුරු කරිසයක් ද, වටම කෙතෙන් කොටස් තුනක් ද, චිතල ගමක කෙතෙන් කුඹුරු කරිසයක් ද, මරොජ කෙතෙන් කුඹුරු කරිසයක් ද, තිසයවිල කෙතෙන් කුඹුරු කරිසයක් ද, තඹර කෙතෙන් කුඹුරු කරිසයක් ද, පතවි කොදිය කෙතෙන් අමාත්‍ය මලිත විසින් කුඹුරු කරිසයක් ද, පනහ ගමක දත්තා විසින් කුඹුරු කරිසයක් ද, මුලවිය කෙතෙන් කුඹුරු කරිසයක් ද, පනහගමක කෙතෙන් කුඹුරු කරිසයක් ද, තලතරවිය කෙතෙන් කුඹුරු කරිසයක් ද, කදානගම කෙතෙන් කුඹුරු කරිසයක් ද, වශයෙන් චෛත්‍යයකට පූජා කිරීමක් පිළිබඳව දක්වා තිබේ (Paranavithana, 1983:10). සම්මතයට අනුව කරිසයක් යනු අමුණු හතරකි. අමුණකට අක්කර දෙකක් හෝ දෙක හමාරක් අයත් වේ. ඒ අනුව 'කරිසයක්' යනු දළ වශයෙන් අක්කර 08 ක් හෝ 10 ක් අතර ප්‍රමාණයකි. දූනුමණ්ඩලකන්ද ලිපියට අනුව චෛත්‍යයට පූජා කොට ඇති සම්පූර්ණ කුඹුරු ප්‍රමාණය කරිස එකොළහකි. එනම් අමුණු දළ වශයෙන් 90 ක්, 110 ක් අතර ප්‍රමාණයක් බව උපකල්පනය කළ හැකි ය. මේ සියලු කුඹුරු ඉඩම් භාතිකතිස්ස රජුගේ භුක්තියෙහි පැවති ඉඩම් ය. කරිස දෙකක් පමණක් අමාත්‍ය මලිත හා දත්තා විසින් පරිත්‍යාග කිරීමක් පිළිබඳව සඳහන් ව තිබේ. මෙම ශිලා ලිපියට අනුව විහාරයට පූජා කර ඇත්තේ විශාල කුඹුරු ප්‍රමාණයක් බව සිතාගත හැකි ය. මෙපමණ විශාල කුඹුරු ප්‍රමාණයක් එක් චෛත්‍යයකට පූජාවීම තුළින් එම චෛත්‍ය නඩත්තුව සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වැය කිරීමට සිදුවී ඇති බව පැහැදිලි වේ. සෑම කුඹුරකින්ම කරිසය බැගින් භුක්තිය උදෙසා ලබා දෙන්නේ විහාරයේ දෛනික අවශ්‍යතා ඉටු කර ගැනීම උදෙසා ය.

කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ගනේකන්ද ලිපියෙහි (Paranavithana, 1983 :111-112) භාතික රජු විසින් විහාරයකට දුන් කුඹුරු පිළිබඳව දීර්ඝ විස්තරයක් ඇතුළත් වේ. ලිපියේ සඳහන් ආකාරයට රජු විසින් තුලතර තිස කෙතේ මහරජක කුඹුරෙන් කරිස්සක් ද විහාරයට ලබාදී තිබේ. එසේම තනගමෙහි කෙහෙකෙතෙන් විහාරයට ලබාදුන් කුඹුරු ප්‍රමාණයක් පිළිබඳව සඳහන් කර ඇතත් එම කුඹුරු ප්‍රමාණය කුමක් ද යන්න පැහැදිලි නැත. එසේම කුබුඩ කඩරක කෙත ද, හා කෙතෙන් කරිස භාගයක් ද, ගැටහාන කෙතෙන් කරිස භාගයක් ද, කහවන කෙතේ අතලසත කුඹුර ද කුලදක කෙතෙන් කරිස භාගයක් ද, විහාරයට පූජා කළ බව සඳහන් වේ. මීට අමතරව සුධම්ම නම් පුද්ගලයා විසින් සුධම්ම චෛත්‍යයට පූජා කරන ලද මාසක 200 ක පරිත්‍යාගයක් පිළිබඳව ද අභිලේඛනයෙහි දක්වා තිබේ. රජු විසින් කරන ලද කුඹුරු පරිත්‍යාග එමගින් නිසි ගණනයක් සිදු කළ නොහැකි මුත් විශාල කුඹුරු ප්‍රමාණයක භුක්තිය විහාරයට පැවරී ඇති බවක් පැහැදිලි ය. මෙම ශිලා ලිපියේ එන 'පුන' යන සඳහනට අනුව එක් කුඹුරු ප්‍රදානයකින් නොනැවතී විටින් විට සිදු කරන ලද කුඹුරු පරිත්‍යාග කිරීමක් පිළිබඳ ව තොරතුරු අනාවරණය වේ. එමගින් පැහැදිලි වන්නේ විහාරය ආශ්‍රිත දේපළ පරිහරණයේ දී කාලානුරූපීව අවශ්‍යතා සංකීර්ණ වන විට වැඩි වශයෙන්

ඉඩම් පරිත්‍යාග කරන්නට පාලකයන්ට සිදුවී ඇති බවයි. එම නිසා තම භුක්තියේ පැවති කුඹුරු ඉඩම් එකින් එක විහාරයට ලබාදීමක් රජු විසින් සිදුකර ඇත. වැවක මත්ස්‍ය භාගය ද, කුඹුරක අඩ කරිසය ද භික්ෂු සංඝයා වෙත පූජා කරනු කහටගස්දිගිලියේ ගිරි ලිපියෙහි (ශිලා ලිපි සංග්‍රහය වර්ෂය සඳහන්ව නැත: 21-24) සටහන් කොට තිබේ. මත්ස්‍ය භාගය පූජා කොට ඇත්තේ මගම විහාරවාසී සංඝයා වෙත වූ අතර අඩ කරිසය පොදුවේ සංඝයා වෙත පිදීමක් සිදුකර ඇත. ''මත වියෙහි කළවිට කුඹර අඩකරිහි මහ බිකුසගහටය දිනි.... මතවියෙහි කළවිට කුඹුරෙන් අඩකරිසයක් මහ භික්ෂු සංඝයාට දෙන ලදී" යන්න මෙහි සරල අර්ථයයි. මෙහි එන අඩ කරිසයක් පිදීම පෙර සිට පැවත එන සම්මත ප්‍රමාණයකැයි සිතිය හැකි ය. ගල්ලෙන විහාර ලිපියෙහි ''අඩ කරිහ බුමි දිනෙ'' යනුවෙන් සඳහන් වන්නේ ද මේ කියන ලද ආකාරයේම අඩකරිස ප්‍රදානයක් පිළිබඳවයි. 'අඩ' යන්නෙහි 'අර්ධ' යන අරුත ඇත. අඩ කරිසයක් යනු දෑ අමුණකි. කරිස, කරිහ, කරිහි යනු කුඹුරු පිදීමේ සිරිත ඇතිවීමෙන් පසුව ලියැවුණ ලිපිවල නිතර මුණගැසෙන වචනයකි. කරිසයක් අමුණු හතරක් යැයි ද කරිසයක හතරෙන් පංගුවක් පයක් යැයි ද සම්මතයයි (Wickramasinghe, 1933: 189-190). ඒ අනුව ප්‍රදාන වී ඇත්තේ අඩ කරිසයක් හෙවත් අමුණු දෙකකි. මෙම මිනුම් ක්‍රමවේදය එකොළොස් වන සියවසෙන් පසුව අභාවයට ගිය බවක් ද දක්නට ලැබේ.

හොරොව්පොතාන ප්‍රදේශයට අයත් ගල්කිරිකන්ද පර්වත ලිපියෙහි (Wickramasinghe, 1994: 117-118) භාතිය රජු විසින් චෛත්‍යයකට පූජා කරන ලද කුඹුරු පිළිබඳව සඳහන් කර ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් පහළ තම්මැන්නාව පර්වත ලිපියෙහි (Paranavithana, 1970 : 121-122) ආරාමයකට හා චෛත්‍යයකට පූජා කරන ලද කුඹුරු පිළිබඳ ව සඳහන් වෙයි. එහි පෙළෙහි සඳහන් ආකාරයට මජිමගම කෙතේ අබල කුඹුරෙන් කරිස්සක් ද, රජුගේ කාලයේ දී ම උලාර නම් පුද්ගලයා විසින් පාදුවිය කෙතෙහි චත කුඹුරෙන් කරිස්සක් ද පූජා කර ඇත. පකරවඩක කෙතේ දුබල කුඹුරෙන් කරිස්සක් ද, අතර කඩක කෙතෙහි පහන කුඹුරෙන් කරිස්සක් ද, රචිත විනිය කෙතේ ජබු කුඹුරෙන් කරිස්සක් ද, චෛත්‍යයට අයිති ය. මීට අමතරව අකලාභි නම් කාන්තාව විසින් මන අවණි වැවේ මත්ස්‍ය භාගය ද චෛත්‍යයට පූජා කොට තිබේ. මෙහි එන 'මතෙර මජිබක' යන්න විමර්ශනය කළ යුතු ව ඇත. 'මතෙර මජිබක' යනුවෙන් පුරාණයේ පැවති බද්දක් පිළිබඳව සඳහන් වන බව පරණවිතානයන්ගේ මතයයි (Codrington & Paranavitana, 1994: 228). මතරමෙජිබක,මතරමජිබික, මතිරමජිබක, මතෙරමජිබකි, මතෙරමජිබුක හා මතෙර මජිබිකපති යනුවෙන් මෙය අභිලේඛනයන්හි දැකිය හැකි ය. ගෝඨාභය රජතුමාගේ තිඹිරිවැව ලිපියේ (Paranavithana, 1983 : 107-108) එන මෙම පාඨයට අනුව එය බදු විශේෂයක් බව පැහැදිලි ය. එහෙත් මහරත්මලේ ලිපියෙහි එන 'මජිබක' යන්නට අරුත් සපයන වික්‍රමසිංහ හා මුලර් එමගින් 'මජිබුක' නම් තෙරුන් කෙනෙකු පිළිබඳ ව සඳහන් වන බව දක්වයි. මේ පිළිබඳ ව අදහස් දක්වන විමලකිත්ති හිමියෝ 'භික්ඛු' ශබ්දයට බිකු, බුක, බික යන රූපයන් ගැනීමට හැකි වුවත් එය නොගැළපෙන බවත් බිකු, බුක, බික ශබ්දයන්ගේ මුල්

රූපය 'බක' වන අතර එය 'භාග' ශබ්දයෙන් යෙදීමට හැකි බව දක්වා තිබේ.'මතෙර' ශබ්දය මාතෘ, මාතෘකා යන ශබ්දයන්ට සමාන වන හෙයින් මෙය 'ඇල' යන අර්ථය ගෙන ඇති නිසා 'මතෙර මජිබක' යනු ජලය සම්බන්ධයෙන් අයකළ බද්දක් බව පැහැදිලි ය. ඒ අනුව මෙය වැව, අමුණ, ඇළ යනාදියෙන් අයකරන ලද මච්චවිභාග නම් වූ විශේෂ බද්දකි. ක්‍රි.ව. පස්වන සියවසේ බුද්ධඝෝෂ හිමියන් ලියූ අටුවා කතාවක් වූ පපංචසූදනියේ 'මච්චභාග' යනුවෙන් සඳහන් බද්ද මෙය විය හැකි ය. (පපංචසූදනිය, II කාණ්ඩය, 349) කුඹුර හා වැව අතර බැඳි අන්‍යෝන්‍ය සබඳතාවත්, එකී වැව් හා කුඹුරුවල භුක්තියෙන් කොටසක් විහාරයකට පැවරීමත් පිළිබඳව සඳහන් වන නිසා මෙම අභිලේඛනය මෙරට සාම්ප්‍රදායික ඉඩම් භුක්තිය සම්බන්ධයෙන් විශේෂිත වූවක් වේ.

ක්‍රි.ව. 6 වන සියවසට ගැනෙන මහකුමරතස රජුගේ නාගිරිකන්ද ලිපියෙහි[3] (Codrington & Paranavitana, 1994: 115-128) බමණගිරි විහාරයට සිදු කරන ලද කුඹුරු හා වැව් පිදීමක් පිළිබඳ ව සඳහන් කර ඇත. . මහගිරිය වැව හා වැසර ද, චුගරිය වැව හා වැ සර ද, කබුබෙ වැව සහ වැසර ද, කටවනක වැව හා වැසර ද යන මේ වැව් සතර සහ වැසර මහකුමරතස රජු විසින් බමණගිරිය විහාරයට සිව්පසය සඳහා ප්‍රදානය කොට තිබේ. මෙහි එන 'වැව සර' යන්න නිර්වචනය කරන පරණවිතානයන් 'වැව ද මඩ ඉඩම් ද' (Codrington & Paranavitana, 1994: 115-128) ලෙස දක්වා තිබේ. ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයෙහි 'වෙව සර' යන්න නිර්වචනය කරමින් 'වැවට සමීප ඉඩම්, වැවෙන් වතුර ගෙන වපුරන ඉඩම්, වඩා යෝග්‍යය ලෙස දක්වා තිබේ. ඒ අනුව මේ ලිපියේ ද වැව් සතරක් හා ඒවායින් වතුර ගෙන කරන කුඹුරු බමණගිරිය විහාරයට පරිත්‍යාග කොට ඇත. මිහින්තලේ කන්දට යාව තිබෙන ඇත්වෙහෙර නමින් හැඳින්වෙන ස්ථානයෙන් සොයාගත් අංක 1 දරණ ඇත්වෙහෙර පර්වත ලිපිය[4] (Paranavithana, 1983 : 37-38) පරිභණ්ඩ චෛත්‍යය සඳහා පූජා කරන ලද කුඹුරු කරිස තිස් එකක් පිළිබඳ ව සඳහන් කරයි. පෙළෙහි සඳහන් ආකාරයට නාග මහරජු විසින් චලදහ ගමේ ආදායම් දෙක ද උපලව වැවේ වපසරියට අයත් වන කුඹුරු කරිස තිස් එක ද පරිභණ්ඩ චෛත්‍යයේ ප්‍රයෝජනය සඳහා පරිත්‍යාග කළ බවක් දක්වා තිබේ. ඒ අනුව පර්වත ලිපියේ මූලික අරමුණ වන්නේ මිහින්තලේ පරිභණ්ඩ නම් ස්තූපයට 'චලදහ' නමැති ගමෙන් රජයට ගෙවිය යුතු ආදායම් දෙකක් සහ 'උපලව' නම් වැව යටතේ තිබුණු කුඹුරු කරිස තිස් එකක් පූජා කළ බව ලියාපදිංචි කර තැබීමයි. මෙහි එන නාග මහරජු 'මහාදාඨික මහානාග රජු බව පරණවිතානයන් පෙන්වා දී තිබේ. (Paranavithana, 1983 : 37-38) මෙහි සඳහන් 'පරිභණ්ඩ' චෛත්‍යය යනු කුමන ස්තූපයක්

3 ''මහගරිය වෙවසර (ෙ)වද චුගරිය වෙවසර (ෙ)ව කටවනක - පුල සර වෙ (ෙ)වව (ෙ)ව ම චතර වෙවසර දක පෙත කඩය බෙජිපෙත බමණගිරිය වහෙරෙ බික සඟහට චර පචයට දිනෙ"

4 අංක 1 දරණ ඇත්වෙහෙර පර්වත ලිපිය,
"සි නක - මහරජ චලදහ - ගම
(දො) - පතිය උපලව දත - විරෙහි
එක (ති) ස - කරගක කුබර (පො) රි (බඩ)
චෙත හමය දිනෙ"

ද යන්න පිළිබඳව ද පරණවිතානයන් සිය අදහස දක්වා තිබේ. 'පරිබණ්ඩ' යන වචනයේ එකතුව හෝ පරිවාර යන අදහස තිබෙන බැවින් මෙය මිහින්තලේ පරිවාර කන්දක පිහිටි ස්තූපයකැයි පරණවිතානයන් පෙන්වා දෙයි. (Paranavithana, 1983 : 37-38) එහෙයින් වර්තමානයේ 'ඇත් වෙහෙර' නමින් ව්‍යවහාර වන පැරණි නටබුන් ස්තූපය පැරණි යුගයේ 'පරිහණ්ඩ චෛතිය' වන්නට ඇති බව එතුමා මත පළකර ඇත. මෙහි එන 'උපලව වැව' උපලවි ගමේ පිහිටි වැවක් විය හැකි ය. රාජගිරි ලෙණ කන්දේ ලෙන් ලිපියක 'උපලවි වසික තිස තෙරහ-'' යනුවෙන් සඳහන් වීම නිසා 'උපලවි' යනු ගමක් බවට සැකයක් නැත (Paranavithana, 1983 : 37-38). එනිසා ඇත්වෙහෙර ලිපියේ එන උපලව වැව එම ගමේ පිහිටි වැවක් විය හැකි ය. රජු විසින් පරිත්‍යාග කරන ලද කුඹුරු කරිස 31 උපලව වැවේ වපසරියට අයත් ඒවා ය. එනම් උපලව වැවෙන් දිය ගෙන අස්වද්දන කුඹුරු තිස් එකකි. කරිස 31 ක් යනු අමුණු එකසිය විසි හතරකි. දළ වශයෙන් මෙය අක්කර 240 ක් හෝ 310 ක් අතර ප්‍රමාණයකි. මෙපමණ විශාල කුඹුරු ප්‍රමාණයක් රජු විසින් චෛත්‍ය භුක්තියට පැවරෙන්නේ එහි ප්‍රයෝජනය උදෙසා ය. ඒ අනුව චෛත්‍ය නඩත්තුව උදෙසා විශාල මුදලක් වැයවන්නට ඇති බව පැහැදිලි වේ.

රාජකීයයන් පමණක් නොව වංශවතුන් සහ සාමාන්‍ය ජනතාව විසින් ද ලෝකෝත්තර නිර්වාන සුවය අපේක්ෂාවෙන් විහාරස්ථ අවශ්‍යතා පූරණය කරනු පිණිස කුඹුරු ඉඩම් පරිත්‍යාග කර තිබේ. කාසිමෝට්ටෙයි පර්වත ලිපියෙහි (Paranavithana, 1983 : 73-74) වසභ රජුගේ ඇමතියෙක් ස්තූපයකට කුඹුරු කරිස 22 ක් පරිත්‍යාග කළ බව දක්වා තිබේ. එහි දැක්වෙන ආකාරයට දේවනාග නම් ඇමතියා විසින් කරහෙනය කෙතෙන් කරිස දෙකක් ද, බමනවිල කෙතෙන් කරිස තුනක් ද, මහචපහනිය කෙතෙන් කරිස්සක් ද, කිරිදිවට කෙතෙන් කරිස දෙකක් ද, පහනවිලට කෙතෙන් කරිසයක් ද, ආදී වශයෙන් කුඹුරු කරිස 22 ක් පරිත්‍යාග කිරීම පිළිබඳව දක්වා ඇත. ලිපියෙහි තැනින් තැන අකුරු මැකී ගොස් තිබෙන නිසා සම්පූර්ණ කරිස ප්‍රමාණ පූජා කළ ස්ථාන පිළිබඳ ව අනාවරණය කර ගැනීමට නොහැකි වී ඇත. එහෙත් කරිස එකක්, කරිස තුනක්, කරිස හතරක් ආදී වශයෙන් ප්‍රමාණ සඳහන් වී තිබීම නිසා සම්පූර්ණ කරිස ප්‍රමාණය 22 ක් බව ගණනය කිරීමට හැකි වී තිබේ. එනම් අමුණු 88 කි. මෙතරම් විශාල අමුණු ප්‍රමාණයක් ස්තූපය උදෙසා වෙන්වූයේ එහි නඩත්තු වියදම් අධික වූ නිසා වෙන්නට පුළුවන. කෙසේ වෙතත් මෙම භුක්ති ප්‍රදානය සිදුකරන්නේ රජුගේ ඇමතියෙක් විසිනි. ඒ අනුව කුඹුරු ඉඩම්හි භුක්තිය රජවරුන් සතුව පමණක් නොව ප්‍රභූන් හා සාමාන්‍ය ජනතාවගේ අයිතියේ ද පැවති බව පැහැදිලි වේ. කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් බිම්පොකුණු ශිලා ලිපියෙන් ද (Paranavithana, 2001 : 293) චඩුල නක ඇමති විසින් චෛත්‍යයකට පූජා කරන ලද දෙකිරියක් කුඹුරු පිළිබඳව සඳහන් කර ඇත.

කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් දෙවැනි සේනගේ හෝ සිව්වැනි දප්පුලගේ පාලන කාලයට ගැනෙන ගොන්නෑව දේවාල ටැම් ලිපියෙහි (Codrington & Paranavitana, 1994: 186-

191) පමුණු භුක්තියට යටත් වූ කුඹුරු ප්‍රදානයක් පිළිබඳ ව සඳහන් කරයි. අභිලේඛනයෙහි මුඛ්‍යාර්ථය වන්නේ මහමිණිලැබිම්හි ඉඩම් යායක් පමුණු භුක්තියට යටත්ව අග්බෝ මුගයින් වරදාන නැමැත්තාට පවරාදීමක් පිළිබඳ ව සඳහන් කිරීම ය. සාමාන්‍යයෙන් පමුණු වශයෙන් ඉඩමක් ප්‍රදානය කිරීමේදී ඉඩම ලබන්නාට ඉඩම් භුක්ති ක්‍රමය තුළ අත්විය හැකි ඉතාම සම්පූර්ණ හිමිකම පැවරෙන බව එල්.එස්. පෙරේරා විසින් සඳහන් කොට තිබේ. ඒ අනුව එම ගනුදෙනුව ඉඩම මුළුමනින්ම විකිණීමකට සමානබැව් සිතිය හැකි ය. ලිපියේ පෙළෙහි සඳහන් ආකාරයට හැම කුඹුරු කිරියක් සඳහා වී අමුණක් බැගින් වූ පංගුවක් හැම කන්නයේම මහාවිහාරයේ ඇතුල් විහාරයට ගෙවිය යුතු බව සඳහන් කර ඇත. ''කිරියක් සඳහා වී අමුණක් බැගින් වූ පංගුවක්'' වශයෙන් එන සඳහන ද විමර්ශනය කළ යුතු ය. පංගුව යන අස්වැන්නෙන් එතරම් විශාල කොටසක් නොවූ බව ද පෙනේ. සද්ධර්මාලංකාරය දක්වන ආකාරයට හොඳ කුඹුරකින් වපුරන සෑම පැලකටම වී යාලක එනම් අමුණු 20 ක අස්වැන්නක් බලාපොරොත්තු විය හැකි ය[5] (සද්ධර්මාලංකාරය, 1934: 10). මේ නයින් බලන විට කුඹුරු කරිස්සකින් අමුණු 320ක අස්වැන්නක් ලැබේ. කුඹුරේ එලදාව මෙයින් අඩක් ලෙස සිතුවත් විහාරයට ලැබෙන පංගුව ඒ තරම් විශාල කොටසක් නොවන බව පෙනී යයි. එනිසා වැඩි වරප්‍රසාද ඉඩම් හිමියාට ලැබෙන බව තහවුරු කර ගත හැකි ය.

විහාරාරාම අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා ස්ථාවර ආදායම් ක්‍රම සපයා දීමේ දී කාන්තාවන් විසින් කළ කුඹුරු ඉඩම් පරිත්‍යාග පිළිබඳ අභිලේඛනගත සාක්ෂ්‍යය ද අතිශය වැදගත් වේ. සිතුල්පව්ව පර්වත ලිපියට (Paranavithana, 2001 : 261-262) අනුව තිස්සා උපාසක හා සමත උපාසිකාව විසින් අවශ්‍යතා දෙකක් උදෙසා භික්ෂූන්ට ප්‍රදානය කරන ලද කුඹුරු කිහිපයක් පිළිබඳ ව සඳහන් කර තිබේ. පෙළෙහි සඳහන් ආකාරයට රකිතවිල වාසය කරන උපාසක තිස්සා විසින් ශ්‍රමණ වෘත්තියට අයත් ආශ්‍රමයකට ලවජකහ කුඹුරෙන් කරිස්සක් ප්‍රදානය කර තිබේ. එසේ ම සමතා උපාසිකාව විසින් කුඹුරු කරිස්සක් ජිනපටිසතරිය හෙවත් දිරාගිය පිළි ඇතුළුකොට මසන ලද මෙට්ට ඇතිරීම සඳහා පූජා කර තිබේ. උපාසක විසින් කුඹුරු ප්‍රදානය කරන්නේ නියත කොට ය. එනම් නිශ්චය කොට ය. මෙම ශිලාලිපියෙන් පැනනැගෙන විශේෂම කාරණය නම් සාමාන්‍ය ජනතාව සතුව ද කුඹුරු ඉඩම් අයිතිය පැවති බවයි. ඒ අතරිනුත් කාන්තාවන් සතුව පැවති කුඹුරු අයිතියක් පිළිබඳ ව හෙළිදරව් වේ. අතීත ශ්‍රී ලාංකේය සමාජයේ පුරුෂයන්ට මෙන් ම කාන්තාවන්ට ද ඉඩම් අයිතිවාසිකම් සමව තිබූ බවට ස්ථිර සාධක මේ තුළින් නිරූපිත වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් කොක්ඇඹේ ශිලාලිපියෙහි ද (Paranavithana, 1983 : 118-119) සංඝගේ දියණිය වූ තලතා ලචි විසින් සිදු කරන ලද කුඹුරු ප්‍රදානයක් පිළිබඳ ව සඳහන් කර තිබේ.

---

5 හොඳ කුඹුරකින් වපුරන සෑම පැලකටම වී යාලක නැතහොත් අමුණු විස්සක අස්වනු බලාපොරොත්තුවිය හැකි බව සද්ධර්මාලංකාරය දක්වයි. මේ අනුව කුඹුරු කිරිය එකකින් වී අමුණු 320 ක අස්වැන්නක් ලැබේ. කුඹුරේ එලදාව මෙයින් අඩක් ලෙස ගත්තත් විහාරයට ලැබෙන පංගුව විශාල එකක් නොවේ.

**කුසල් තකා කුඹුරු ඉඩම්**

සංකීර්ණ විහාර අවශ්‍යතා පූරණය කර ගැනීම සඳහා කුඹුරු ඉඩම් පරිත්‍යාග කිරීමේ දී කුසලයක් අත්පත් කර ගනිමින් නිර්වාණාවබෝධයට මංපෙත් විවර කර ගැනීම ඒකායන පරමාර්ථය වී තිබේ. ක්‍රි.ව. 12 වන සියවසේ සිට ක්‍රි.ව. 15 වන සියවස දක්වා ඉඩම් භුක්තිය දෙස අධ්‍යනය කරන විට මේ යුගය පුරාවටම 'කුසලාන්' යන යෙදුම නිතර දක්නට ලැබේ. I වන විජයබාහු රජුගේ කාලයට අයත් පොළොන්නරුව ටැම් ලිපියෙහි (Wickramasinghe, 1994: 311). 'සපුගම්වත් වැ සර' නම් ප්‍රදේශය මහ වෙහෙර බඳ වතුකුරු පිරිවෙනට කුසලාන් කොට පුදා තිබේ. පළමුවන විජයබාහු රජුගේ අඹගමුව ශිලා ලිපියේ 'මෙතුවාක් තැන් කුසලාන් කොට' යනුවෙන් දක්වා තිබේ (Wickramasinghe, 1994: 212). පොළොන්නරු යුගයේදී ම මාණාභරණ රජු විසින් තලාමුහුන්ද්ගිරි නම් විහාරයට කුසලාන් කොට දෙන ලද අමුණු 13ක ඉඩම් ප්‍රදානයක් පිළිබඳ ව කටගමුව පුවරු ලිපියෙහි (Wickramasinghe, 1994: 145) සඳහන් වී තිබේ. **චූලවංසය** දක්වන්නේ මුදල් හිඟකම නිසාවෙන් ඔහු දළදා සිද්ධස්ථානයට පවරා තිබූ ධනය ද, භික්ෂූන්ට අයත්ව තිබූ ගම්බිම් ද, සියල්ල පැහැරගත් බවකි. **චූලවංශ පුවත** කෙසේ වෙතත් ඔහුගේ පාලන සමය ත්‍යාගශීලී භාවයෙන් මුළුමනින්ම තොර නොවූ බව කටගමුව ශිලා ලිපියේ දැක්වෙන කුසලාන් ප්‍රදානයෙන් පැහැදිලි වේ. එහි සඳහන් ආකාරයට මතිරදෙණියෙන් දසාමුණක් ද, කොසොබුරෙන් අමුණු තුනක් ද, තවත් අමුණු තිහක් ද, තලාමුහුන්දුගිරි විහාරයට කුසලාන් කොට දී තිබේ. කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් බතලගොඩ විහාර ශිලාලිපියේ (Codrington & Paranavitana, 1994:78) ද ක්‍රි.ව. 1202 දී පමණ සෙනෙවිරද් පිරිවෙන් විහාරයට බිජුවට සතර අමුණක් කුසලාන් කොට දුන් බව සඳහන් වේ. ගලපාත විහාරයට කුසලාන් කොට දුන් සියඹලාපය නම් ඉඩමක් ද, ඊට යාබද සුඹුල්පත් ඇල්ල ඇතුළු වූ තැන කුඹුරු හා පොල් පුවක් ඇතුළු කොළ වෙල් අය ද ප්‍රදානය කිරීමක් පිළිබඳ ව ගලපාත ලිපියේ විස්තරාත්මකව දක්වා තිබේ. මෙම ලිපිය දෙවන පරාක්‍රමබාහු කාලයට ගැනෙන බැවින් දඹදෙනි යුගය වන විට ප්‍රත්‍ය සඳහා ද කුසලාන් දී තිබෙන බව පැහැදිලි ය. මෙසේ විවිධ ලේඛනවල එන 'කුසලාන්' යන්නට අර්ථ නිරූපන සපයන පරණවිතානයන් 'ආගමික ප්‍රදාන' යනුවෙන් දක්වා තිබේ (Wickramasinghe, 1994:95). එච්.සී.පී. බෙල් ජලවාචී 'කුස' ශබ්දය හා දානවාචී 'ලාන' යන ශබ්දය එක්වී 'කුසලාන්' යන්න සැකසී ඇතැයි දක්වා ඇත. (ගුණවර්ධන, 1993 :78) ඔහුට අනුව 'පැන් වත් කිරීමෙන් දෙන හා ලබන පරිත්‍යාගය' කුසලාන් වේ. 'කුසල ශ්‍රාවන' යන පදයෙහි සම්භවය පිළිබඳ අදහස් දක්වන ඩබ්.එස්. කරුණාරත්න මහතා 'පුණ්‍යමය පරිත්‍යාගයක් ප්‍රකාශයට පත් කිරීම' වශයෙන් 'කුසලාන්' යන්න නිර්වචනය කොට තිබේ (Paranavitana, 1955:143-144). 'කුසලාන් කළ' යන්නෙන් බිඳී ආ 'කොහොළන් කළ' යන්න සංඝයාට පිරිනමන ලද දේපළ' හැඳින්වීම සඳහා භාවිත කරන ලද බව ඔහු වැඩි දුරටත් දක්වා තිබේ. පුණ්‍යවාචී 'කුසල්' හා ස්ථානවාචී 'ආන' ශබ්දය එකතු වීමෙන් සැදුනු 'කුසලාන' යන්නෙන් 'කුසල් පිණිස යෙදූ ගම්' අර්ථවත් වන බව වැලිවිටියේ සෝරත හිමිගේ අදහසයි. (දළදා සිරිත, 1955 :102;

ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, 1928: 266) ඩී.ඇම්. ඉසෙඩ් වික්‍රමසිංහයන් 'පාන පත්‍ර' හෙවත් 'බොන භාජනය' යනුවෙන් වෙනස්ම අදහසක් ප්‍රකාශ කර තිබේ (Wickramasinghe, 1994:100). එහෙත් බොහෝ වියතුන්ගේ මතය 'කුසල් තකා පිදූ ඉඩම්' යන අර්ථයයි. මෙසේ හඳුනාගනු ලබන කුසලාන් වර්ග දෙකක් පිළිබඳ ව පොළොන්නරු යුගයේදී අසන්නට ලැබේ. 'දරු කුසලාන්' හා 'මහ කුසලාන්' වශයෙනි. නිශ්ශංකමල්ලයන්ගේ ගල්පොත ශිලා ලේඛනයෙහි (Wickramasinghe, 19941955:144). යනුවෙන් 'දරු කුසලාන්, මහ කුසලාන්' පිදූ බවත් දක්වා තිබේ. දළදා සිරිතේ ද 'දරු කුසලාන්, මහ කුසලාන්' පිළිබඳව දක්නට ලැබේ. එච්.සී.පී. බෙල් මහතාගේ මතයට අනුව 'පින්තකා පුදන ලද ලොකු කුඩා ඉඩම් දරු කුසලාන්, මහ කුසලාන් යන්නෙන් අදහස් වේ (රෝහණධීර, 2001:03). ඩී.ඇම් ද ඉසෙඩ් වික්‍රමසිංහයන්ගේ අදහස 'පූජ්‍ය හෝ රාජකීය' යන අරුත් දෙන බව ය (E.Z. 1912:199).

## විහාර උදෙසා පූජා කළ කුඹුරු ඉඩම්හි මූල්‍ය වටිනාකම්

සමකාලීන යුගයෙහි කුඹුරු ඉඩම් භුක්තිය විෂයෙහි දක්නට ලැබෙන වැදගත්ම කාරණයක් නම් කුඹුරු ඉඩම් මිලයට ගත් ඒවා බව සඳහන් වීම ය. ''කෙණවි'' යනුවෙන් ලිපියේ එන සඳහන 'මිලදී ගෙන' යන අර්ථයෙන් යෙදුණකි. මෙය 'කිණිත්වා' යන්නට සමාන පූර්ව ක්‍රියා රූපයකි. විහාරේගල ලිපියෙහි 'කිණිය' යනුවෙන් මිලදී ගැනීම සඳහන් කොට ඇත. කිණාපෙත්වා (ඛණාපෙත්වා), කෙණවය, කෙණවිය, කෙණෙවි වශයෙන් මෙම වචනය සකස් වන්නට ඇත. නාගිරිකන්ද ලිපියේ කුඹුරු මිලදී ගැනීමක් පිළිබඳ ව සඳහන් වීම නිසා සමකාලීන සමය වන විට කුඹුරුවල අයිතිය මිලදී ගැනීමෙන් තමා සතු කරගත් බව පැහැදිලි වේ. මෙම මිලදී ගැනීම රජකු විසින් සිදු කර ඇති නිසා රජුගේ ඉඩම් භුක්තිය පිළිබඳ සංකල්පය තරමක් ගැටලු සහගත වී තිබේ. රජෙකුට වුව මිලදී ගැනීමෙන් අයිතිය තහවුරු කර ගැනීමට සිදු වූයේ රාජ්‍ය නිලධාරීන් මෙන් ම සාමාන්‍ය ජනතාව සතුව ද ඉඩම් අයිතිය පැවති නිසා බව මෙනයින් උපකල්පනය කළ හැකි ය. දඹුලුගල මුදුනේ පිහිටි ලිපියෙන් (Paranavithana, 2001:278-280) මෙවැනිම කුඹුරු මිල දී ගැනීමක් පිළිබඳ ව සඳහන් කොට තිබේ.

ක්‍රි.පූ. 02 වන ශතවර්ෂයට අයත් තෝරවමයිලෑව ලිපියේ (අමරවංශ, 1969: 86) තිසපවත සෑයට හා භික්ෂු විෂයෙහි පුදන ලද කුඹුරු ප්‍රමාණ පිළිබඳ ව දක්වා තිබේ. එහි සඳහන් වන පරිදි මහ අතුල නම් ඇමතියා විසින් තිසවිය, රතවිය, දමවිය, මතුක යන කුඹුරුවලින් කොටස බැගින් තිසපවත සෑයට හා භික්ෂූන්ට පූජා කර ඇත. ලිපියෙහි දක්වන විශේෂිත කාරණය නම් මහ අතුල ඇමතියා මෙම කුඹුරු සියල්ල දහසක් දී මිලදී ගැනීමක් පිළිබඳ ව සඳහන් කර තිබීමයි. ඒ අනුව සමකාලීන යුගයේදී ඕනෑම අයෙකුට ඉඩම් මිලදී ගැනීමටත්, විකිණීමටත්, පරිත්‍යාග කිරීමටත් හැකියාවක් පැවති බව පැහැදිලි වේ. මහ අතුල යනු ඇමතියෙකි. රජුට පමණක් නොව විවිධ තනතුරු දරන ලද පුද්ගලයන්ට පවා කුඹුරු ඉඩම් මිලදී ගැනීමේ හැකියාව පැවතී ඇති බව තහවුරු කරගත හැකි ය. ඔහු විසින් මිල දී

ගත් කුඹුරු වලින් කොටස බැගින් විහාර භුක්තිය උදෙසා පැවරීමක් සිදු කර ඇත. සෑම කුඹුරකම ක භුක්තිය තමා යටතේ තබාගෙන ක භුක්තිය වශයෙන් ප්‍රදානය කළ බවක් පැහැදිලි වේ.

ක්‍රි.ව. 10 වන ශතවර්ෂයට අයත් එප්පාවල ලිපිය[6] (Wickramasinghe & Codrington, 1994: 188, විමලකීර්ති, 2500: 99-100) කුඹුරු ප්‍රදාන සම්බන්ධයෙන් වූ ඉඩම් භුක්තියෙහි නව ප්‍රවණතා නිරූපිත අභිලේඛනයකි. උකුණු හසකෝට්ටා නම් තැනැත්තකු විසින් පමගලු වෙහෙරට හා එහි බෝධියටත් මධුප්‍රකාරාදිය සමග නොකැඩුණු හාලේ දෙපතක බත් ප්‍රදානය පිණිස රන් කලන් 08 ක් දී මිලදී ගත් 'ගලම්බුරු කැරය' නම් කුඹුරක ක් ද, පොලී වශයෙන් වී ලැබෙන සේ දුන් රන් කලන් 2 ක් ද, යන රන් කලන් 10 ක් පිදූ බවත්, ඒ විහාරයේ පූජාසනයේ වියන සඳහා වී පොලියට දුන් තවත් රන් කලන් දෙකක් පිදූ බවත්, මතුවට ඒවා සුරක්ෂිත කළ යුතු බවත්, දැක්වීම ලිපියේ අරමුණ වේ. මෙහි සඳහන් ආකාරයට උකුණු හස කොට්ටා, ගලම්බුරු කැරය' කුඹුරෙන් පයක් මිලදී ගන්නේ කලං අටකට ය. ඒ වෙලාත්මෙ මිහිදු නැමැත්තාගෙනි. මෙහි එන 'වෙලාත්මෙ' යනු ග්‍රාම නාමයක් විය හැකි ය. එකී ග්‍රාමයේ සිටි මිහිදුගෙන් මිලදී ගත්තා යැයි කීමෙන් සමකාලීන සමය වන විට කුඹුරු ඉඩම් මිලදී ගැනීමටත්, විකිණීමටත් සාමාන්‍ය ජනයා සතුව පැවති අයිතිය පිළිබඳව තොරතුරු ලැබේ. රන් කලන් අටකට මිලදී ගත්තේ හලඹුරු කැරයෙහි කුඹුරෙන් එක් පාදයකි. පය + අක් = පයක් වන අතර බොහෝ දේවල්වල හතරෙන් කොටස පාදයකි (Wickramasinghe & Codrington, 1994: 188). පාද සහ පය යන මේවා සමානාර්ථ වේ. පය යනු අමුණකින් හතරෙන් පංගුවකි. නැතහොත් කිරියකින් දහසයෙන් පංගුවකි. ලිපියෙහි සඳහන් පරිදි අමුණු කාලක වපසරිය කහවණු අටක් වන විට අමුණක වපසරිය කහවණු තිස් දෙකකි. කහවණුව ඉංග්‍රීසි ග්‍රේන් 79-82 ප්‍රමාණයක් බව කොඩ්රිංටන්ගේ ගණන් බැලීමයි. කෙසේ වෙතත් තත්කාලීන කුඹුරු ඉඩම්වල මිල සාධකය නිශ්චය කිරීමට එප්පාවල ශිලා ලිපි මගින් පිටිවහලක් ලැබෙන බව කිව යුතු ය. වී තැන්පත් කර පොලිය ලබා ගන්නා බැංකු ක්‍රමයක් ද ලිපියෙන් පැන නැගේ. දෙපතක හෙවත් කාලක මුල් සාලේ බතින් බුද්ධ පූජා පැවැත්වීමට (දෛනිකව) කහවණු දහසක් වටිනා දේ ප්‍රමාණවත් ද යන්න සැකයට තුඩුදුන්නත් සමකාලීන ආර්ථික පරිසරය දෙස බලන විට එය එතරම් දුෂ්කර ව්‍රතයක් නොවන්නට ඇති බව ද පැහැදිලි ය.

### කුඹුරු ඉඩම්වල ආදායම් කොටස් විහාර සංවර්ධනය සඳහා යෙදවූ ආකාරය

විහාරයකට කුඹුරු ඉඩමක් පරිත්‍යාග වන විට එකී කුඹුරු ඉඩම්හි ආදායම් කොටස් විනිවිද භාවයකින් යුතුව විහාර අවශ්‍යතා සඳහා පමණක් යොදවා ගැනීම අත්‍යවශ්‍ය වූ බව පෙනේ. සෑම ආදායම් කොටසක්ම යෙදවිය යුතු විහාර කාර්යභාරය පිළිබඳව ස්ථාවරව දක්වා තිබුණි. එකී ආදායම් ඉන් මෙපිට වෙනත් කිසිඳු කාර්යයක් සඳහා යෙදවීම කළ නොහැකි විය.

6 "උකුණුහස කොට්ටාමි වෙලත්මෙ මිහින්දු අට් කලන්දකට් මට් විකුණෑ තිබු ගලම්බුරු කැරැයෙහි එක් පයක්.."

ක්‍රි.ව. පස්වන සියවසට ගැනෙන කතරගම පුවරු ලිපියෙහි ද[7](ශිලා ලිපි සංග්‍රහය වර්ෂය සඳහන් නැත, 37-42) අවශ්‍යතා කිහිපයක් උදෙසා සිදු කරන ලද කුඹුරු ප්‍රදානයක් පිළිබඳ ව සඳහන් වේ. සරතර නම් කුමාරයාගේ පුත් වූ මහදළ මහන රජු විසින් කතරගම රජමහ විහාරයේ මංගල මහ චෛත්‍යයෙහි ප්‍රතිසංස්කරණ කටයුතුවලට ද, තෙල්, සිවුපසය, ආදිය සැපයීම සඳහා ද නමින් දක්වා ඇති ස්ථූපය පවත්වාගෙන යාම සඳහා ද කුඹුරක් පුදන ලද බව මේ ලිපියේ සඳහන් වේ. ලිපියේ පෙළෙහි සඳහන් ආකාරයට කුඹුරු අමුණු පරිත්‍යාග කරන්නේ මහදළ මහන විසිනි. ඔහු රජකු බව ලිපියෙහිම දක්වා තිබේ. මේ රජු විසින් කුඹුරු පරිත්‍යාගය සිදු කරන්නේ අවශ්‍යතා කිහිපයක් ඉටු කර ගැනීම උදෙසා ය.

මෙහි ප්‍රථම අවශ්‍යතාව කතරගම රජමහ විහාරයෙහි මංගල මහාචෛත්‍ය සීමායෙහි ජිනපටිසතරිය පැවැත්වීම ය. මෙම ලිපිය කිරිවෙහෙරේ සලපතල මළුව මත තිබී හමුවූවක් නිසා මෙහි එන මංගල මහාචෛතය කිරිවෙහෙර විය හැකි ය. ජිනපටිසතරිය යන්න ක්‍රි.ව. 2-5 සියවස්හි ලේඛනයන්හි යෙදේ. බොහෝ විට 'ජිනපටිසතරි' යන පාඨයට පසුව 'කොටු' හෝ 'කරණ කොටු' හෝ දක්නට ලැබීම නිසා දිරාගිය ගොඩනැගිලි කටුකොහොල් ඇරීම මින් අදහස් කෙරෙන බව වික්‍රමසිංහයන්ගේ අදහසයි (ලංකා ශිලා ලිපි සංග්‍රහය, වෙළුම, III, 215). එහෙත් මේ අදහස ප්‍රතික්ෂේප කරන පරණවිතානයන් 'ජිනපටිසතරි' යනුවෙන් මුවහම යොදා සකස් කළ ඇතිරිලි ඇතිරීම අදහස් කෙරෙන බව දක්වා තිබේ. දිරාගිය පිළි (ජින්න පටි) ඇතුළු කොට මසන ලද මෙට්ට ඇතිරීම මින් අදහස් කෙරේ (ශිලා ලිපි සංග්‍රහය වර්ෂය සඳහන් නැත, 39). යැයි පරණවිතාන ශූරීන් දක්වති. කුඹුර ප්‍රදානයේ දෙවන අවශ්‍යතාව පැන් පාදෙනියක් සැලසීම ය. ලිපියේ 'අමපදනි' යනුවෙන් දැක්වෙන්නේ මේ අවශ්‍යතාවයි. ජල + පාදෝනි යන අරුත එහි ඇත. පුරාණ විහාරයන්හි විශේෂයෙන්ම චෛත්‍ය ඉදිරිපස මෙවැනි පාදෙනි තිබුණු බවට සාධක ලැබී තිබේ. රුවන්වැලිසෑයට පිවිසෙන දොරටුවේ පඩිපෙළ අසළින් ද මෙවැනි පාදෙනියක් හමුවී ඇත (ශිලා ලිපි සංග්‍රහය වර්ෂය සඳහන් නැත, 40). ලිපියේ එන 'හය තෙල මිල කොටු ඉඩ' යනු තෙවන අවශ්‍යතාවයි. 'හය' යනු ලිපිවල දක්නට නොලැබෙතත් 'තෙල' හා 'මිල' සමග 'හුත' හෝ 'හුති' යනුවෙන් යොදා තිබෙනු දැකිය හැකි ය. මලුතිසගේ ජේතවනාරාම ලිපියෙහි ද 'තෙල ච හුතිච මුල කොටු' යනුවෙන් දක්වා තිබේ. 'හය' යන්නෙහි 'ගිතෙල්' යන අදහස ද ගත හැකි ය. ඒ අනුව ගිතෙල් පූජාව සිදු කිරීම එක් අවශ්‍යතාවක් කොට ගනිමින් කුඹුර අමුණු විහාර භුක්තියට පැවරෙන්නට ඇත. විශේෂයෙන් විහාරයන්හි පහන් දැල්වීම පවත්වාගෙන යාම සඳහා මුදල් හෝ කුඹුරු හෝ සැදැහැත්තන් පූජා කර ඇති බව පැරණි ලේඛනයන්හි ද සඳහන් වේ. හතරවන අවශ්‍යතාව විහාර මුළුතැන්ගෙය පවත්වා ගැනීම ය. මහ පවටෙහි යන විහාරයට අයත් මුළුතැන්ගෙයයි. දාඨෝපතිස්සගේ ලිපියෙහි 'මහ පවට' යනුවෙනුත් මිහින්තලේ

7 කතරගම පුවරු ලිපිය "සිද්ධම් සරතරයහ පුත මහදළි මහ න රජෙමි (ක) ජගෙම ර ජී මහ වහෙරෙහි මගල මහ චෙයෙ (සි) මෙ ජිනපරිසතරි නව අමපදනි කොටු ඉච හය තෙල මිල කොටු ඉච මෙ වහරෙහිම හ පවටෙහි චතර පචයද පයුතු කරහි කො (ටු) ඉඩ පලිතොටුගමෙ අටදහසිපුර පුවයෙ හකලසයිතෙ (හි) මළුමජින තුබෙ වට්තනි අම(ණ) කුබි දිතිමි"

සිව්වන මිහිඳුගේ පුවරු ලිපිවල 'මහපාවට්' යනුවෙන් ද 'මුළුතැන්ගෙය' දක්වා තිබේ. පස්වන අවශ්‍යතාව චත්තාරෝ පච්චයෝ (චතරපචය) හෙවත් සිවුපසය පවත්වා ගැනීම ය. සයවැන්න ලිපියේ නමින් දක්වා ඇති ස්ථූපය නඩත්තු කිරීම ය. මෙහි එන ස්ථූපය පලිතොටුග මේ අටදහසිපුරේ හකසලයිතෙහි මළුමජින ස්ථූපයයි. තිස්සමහාරාම ලිපියේ එන 'පලි කොටුගම' මේ ලිපියේ දැක්වෙන 'පලිතොටුගමෙ' එකම ස්ථානයක් විය යුතු ය. පලිතොටුග මේ කුඹුරු මහගම රජමහ වෙහෙර වෙත පූජා කිරීමක් එහි සඳහනි. මෙම සියලු අවශ්‍යතා උදෙසාවෙනි මහදළි මහන රජ කුඹුරු අමුණක් වෙන් කරන්නේ. ලිපියෙහි කුඹුර 'කුබි' ලෙස දක්වා තිබේ. බොහෝ විට ශිලා ලිපිවල යෙදෙන්නේ කුබර, කුබරි, කුබුර, කුහර ආදී වශයෙනි. ඒ අනුව 'කුබි' යනුවෙන් දැක්වීම 'කුබර' යන අදහසින් ම යෙදුනක් බව පැහැදිලි ය. කාර්යයන් හයක් සාධනය උදෙසා පූජා කරන්නේ කුඹුරු අමුණකි. මෙය දළ වශයෙන් අක්කර දෙකක් හෝ දෙක හමාරකි. මෙම ශිලා ලිපිය අනුව කුඹුරු ප්‍රදානයේ දී පවා ඒවා පාවිච්චි කරන අන්දම විශේෂිත ලෙස නියම කරමින් භුක්තියට පවරා ඇති බවක් පිළිබඳ පැහැදිලි අදහසක් ගොඩනගා ගත හැකි ය. මේ කාර්යයන්ගෙන් පිටස්තර කාර්යයන් සඳහා අදාළ කුඹුරු ඉඩමේ භුක්තිය යොදා ගැනීම වරදක් ලෙස සිතන්නට ඇත.

### විහාරස්ථ කුඹුරු ඉඩම් සහ ආදායම්හි නිරුපද්‍රිත පැවැත්ම

විහාරස්ථ අවශ්‍යතා පූරණය කර ගැනීම සඳහා පවරා දෙන ඉඩකඩම්හි නිරුපද්‍රිත පැවැත්ම ආරක්ෂා කර ගැනීම සඳහා ද අතීත සම්ප්‍රදාය තුල විධිවිධාන සලසා තිබේ. නේවාසකයන්ගේ කුදු මහත් අවශ්‍යතා ගැටලුවකින් තොරව අඛණ්ඩව ක්‍රියාත්මක වන්නේ එම ඉඩකඩම්හි ආදායම් නිරුපද්‍රිතව හා ගැටලුවකින් තොරව විහාර සන්තක වනවිට ය. දෙවන සේන රජ සමයට අයත් ගැරඬිගල ශිලා ලිපියේ (විමලකිත්ති, 2500: 110-111) ශාසන මාමකයින් විසින් භික්ෂු විෂයෙහි පරිත්‍යාග කරන ලද කුඹුරු ඉඩම් කිහිපයක් පිළිබඳව දක්වා තිබේ. මෙහි එන සිරිසඟබෝ මපුර්මුකා යනු දෙවන සේන රජු ය. මහින්ද මාහාදිපාදයන් විසින් ගොම්බිය නම් ගමෙන් සීමා ගල් පිහිටුවා දෙන ලද කිරියක කුඹුරු ද, බුද්ධ මහාමල්ලයන් විසින් මහබෝදෙනිය නම් ගමෙන් සීමා ගල් පිහිටුවා දෙන ලද දෙපෑළක් කුඹුරු ද, මහාමල්ලයන් විසින් මින්නේරියෙන් සීමා ගල් පිහිටුවා දෙන ලද දෙපෑළක් කුඹුරු ද ලෙන් සේනාසනයට අයත් කොට දී තිබේ. මේ අනුව තිදෙනෙකු විසින් සේනාසනයට අයත් කොට දී ඇති සම්පූර්ණ කුඹුරු ප්‍රමාණය පෑල් හතරක් හා එක් කිරිසයකි. පෑළ යනු අමුණකින් හතරෙන් පංගුවකි. කිරිස්ස යනු අමුණු හතරකි. සම්පූර්ණ ආදායම් ප්‍රදානය අමුණු 05 ක් බව පැහැදිලි ය. මෙහි 'පහණ' හින්ද්වා දුන්' යන යෙදුම ද විමර්ශනය කළ යුතු ව ඇත. එනම් කුඹුරක්ම පරිත්‍යාග කරන්නේ සීමා ගල් පිහිටුවීමෙනි. ඒ අනුව පරිත්‍යාග කරන කුඹුරෙහි ප්‍රමාණය නිශ්චය කරදීමක් සිදු කොට ඇත. කිරියක කුඹුර, දෙපයක කුඹුර යනුවෙන් වෙන් කර දීමෙන් භුක්තියේදී ඇති විය හැකි නෛතික ගැටලු මගහැරවීම අපේක්ෂා කරන්නට ඇත.

*ISSN (Online): 2961-564X ISSN (Print) : 2362 - 0706*

## නිගමනය

ඉහත සඳහන් කළ තොරතුරුවලට අනුව පුරාතන ලංකාවේ ආදායම් උපදින ප්‍රධාන මාර්ග යක් ලෙස ආර්ථික ක්ෂේත්‍රයේ ප්‍රධාන ස්ථානයක රඳවා සිටි කුඹුරු ඉඩම් ආගමික සංස්ථාව විෂයෙහි පරිත්‍යාග වන විට ඒවායේ ආදායම් නිසි කළමනාකරණයකින් යුක්තව නේවාසික අවශ්‍යතා පූරණය සඳහා යොදා ගත් ආකාරය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගත හැකි වේ. භික්ෂූන්ගේ ප්‍රත්‍ය පහසුව, විහාරාරාම කැඩුම් බිඳුම් ප්‍රතිසංස්කරණ කටයුතු, විහාරස්ථ පුද පූජා කටයුතු සහ සේවකයන්ගේ වේතන ආදී විහාරාරාම හා සබැඳි ඕනෑම අවශ්‍යතාවක් විෂයෙහි එම ආදායම් යොදවා ගැනීමට හැකියාව පැවති අතර එම ආදායම් නිසි කළමනාකාරීත්වයකින් යුතුව යොදවා ලත් බවද අවසාන වශයෙන් නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


වැලිවිටියේ, ශ්‍රී සෝරත ස්ථවිර. (1995). *දළඳ සිරිත,* (සංස්.). කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

සුරවීර, ඒ.වී. (1961) *පූජාවලිය.* (සංස්.). ඇම්.ඩී. ගුණසේන සහ සමාගම. කොළඹ.

සරණතිස්ස හිමි. (1939). *රසවාහිනිය.* (සංස්.). ජිනාලංකාර මුද්‍රණාලය. කොළඹ.

පපංචසූදනිය. II කාණ්ඩය.

ශ්‍රී සුමංගල ශබ්දකෝෂය. ප්‍රථම භාගය. (1999). සෝරත හිමි, වැලිවිටියේ (සංස්.). ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ.

අමරවංශ හිමි, කොත්මලේ. (1995). *ලක්දිව සෙල්ලිපි.* ඇම්.ඩී. ගුණසේන සහ සමාගම. කොළඹ.

ගුණවර්ධන, රණවීර. (1993). *සිවුර සහ නගුල.* සමාජ විද්‍යාඥයින්ගේ සංගමය. කොළඹ.

රෝහණධීර, මැන්දිස්. (2001). *සාංඝික දේපළ.* තරංජි ප්‍රින්ට්ස්, මහරගම.

විජිතනන්ද, සරත්චන්ද්‍ර. (බු.ව. 2550). *ත්‍රිපිටක අර්ථකෝෂය* (සංස්.). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. දෙහිවල.

විමලකීර්ති, මැදඋයන්ගොඩ. (1954). *ශිලා ලේඛන සංග්‍රහය. 3 වන කොටස.* ඩී.පී. දොඩන්ගොඩ සහ සමාගම. මොරටුව.

විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ. (බු.ව. 2550). *ශිලා ලේඛන සංග්‍රහය. 04 වන කොටස.* ඩී.පී. දොඩන්ගොඩ සහ සමාගම. මොරටුව.

ශිලා ලිපි සංග්‍රහය. (වර්ෂය සඳහන් නැත). පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. කොළඹ.

ශිලා ලිපි සංග්‍රහය. දෙවන කලාපය. (වර්ෂය සඳහන් නැත). පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. කොළඹ.

Codrington, H.W., & Paranavitana, S. (1994). *Epigraphia Zeylanica, vol. IV.* ed. New Delhi: Asian Educational Services.

Paranavitana, S. (1955). *Epigraphia Zeylanica, vol. V, Part I.* Ceylon: Printed At the Government Press.

Paranavithana, S. (1970). *Inscriptions of Ceylon, vol. I,* Colombo: Published by the Department of Archaeology.

Paranavithana, S. (1983). *Inscriptions of Ceylon, vol. II, Part 1.* Colombo: Published by the Department of Archaeology. Sri Lanka.

Paranavithana, S. (2001). *Inscriptions of Ceylon, vol. II, Part II.* ed.Malani Dias. Colombo: Published by the Department of Archaeology. Sri Lanka.

Wickramasinghe, Don Martino de Silva. (1994). *Epigraphia Zeylanica, vol. I,* ed. New Delhi: Asian Educational Services.

Wickramasinghe, Don Martino de Silva. (1994). *Epigraphia Zeylanica, vol. II,* ed. New Delhi: Asian Educational Services.

Wickramasinghe, Don Martino de Silva. (1994). *Epigraphia Zeylanica, vol. III,* ed. New Delhi: Asian Educational Services.